// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 2121/1 - 2019 අප්‍රේල් මස 29 වැනි සඳුදා - 2019.04.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.සී. එෆ්. 1/64

### (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත

(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සාදනු ලැබූ නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 අප්‍රේල් මස 29 වන දින,
කොළඹ දී ය.

නියෝග

2019 අප්‍රේල් මස 22 වන දින අංක 2120/5 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2019 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝග මෙහි පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ :-

(1) 2 වන නියෝගයෙහි (1) වන ඡේදයේ -

(අ) "නීතිපතිවරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයේ "ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ, රජයේ නීතිඥ හෝ; "යන වචන වෙනුවට "ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ, රජයේ අධිනීතිඥ හෝ," යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) "ත්‍රස්තවාදය" යන යෙදුමේ අර්ථ නිරූපණයේ (ඒ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඒ) මහජනතාවගේ හෝ එහි යම් කොටසක සෞඛ්‍යයට සහ ආරක්ෂාවට බරපතල අවදානමක් ඇතිකිරීම ; හෝ".

1A - G 29756 — 382 (2019/04)

සැ.යු.- අති විශේෂ ගැසට් අංක 2120/1 කාණ්ඩය අංක 2120/30 න් අවසන් වේ.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) 15 වන නියෝගයේ (13) වන ඡේදයේ -

(අ) (ආ) අනුඡේදයේ "විද්‍යුත් ප්‍රජනන එයට ඇතුළත් වේ;" යන වචන වෙනුවට "විද්‍යුත් ප්‍රජනන සහ යම් කරුණු හෝ වෙනත් අන්තර්ගත දෑ යම් විදුලි සංදේශ උපකරණ හරහා සම්ප්‍රේෂණය කිරීම ද එයට ඇතුළත් වේ ;" ; සහ

(ආ) එම ඡේදයේ (ඈ) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන්:-

"(ඉ) "විදුලි සංදේශ උපකරණ" යන්නට 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය.".

(3) 27 වන නියෝගයේ (1) වන ඡේදයේ -

(අ) එම නියෝගයේ එම ඡේදයේ (අ) අනුඡේදයට පෙරාතුව ම පහත අනුඡේද ඇතුළත් කිරීමෙන්:-

"(අ) සාමාජිකයකු වීම හෝ සමූහයක සාමාජිකයකු වීම;
(ආ) නායකත්වය සැපයීම;";

(ආ) එම ඡේදයේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ)සහ (ඊ)අනුඡේද පිළිවෙළින් එම ඡේදයේ (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ) සහ (ඌ) අනුඡේද ලෙස නැවත අක්ෂර යෙදීමෙන්.

(4) 32 වන නියෝගයට ඉක්බිතිවම පිළිවෙළින් 32අ නියෝගය සහ 32ආ නියෝගය ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන අලුත් නියෝග ඇතුළත් කිරීමෙන්:-

"සම්පූර්ණ මුහුණ ආවරණය කරන යම් ඇඟලුමක්, ඇඳුමක් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් පැළඳීම තහනම් බව

32අ. (1) ප්‍රසිද්ධ ස්ථානයක දී යම් තැනැත්තකුගේ හඳුනා ගැනීමට කිසියම් ආකාරයකින් යම් බාධාවක් විය හැකි පරිදි ඒ තැනැත්තාගේ සම්පූර්ණ මුහුණ සඟවාලනු ලබන යම් ඇඟලුමක්, ඇඳුමක් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් කිසිම තැනැත්තකු විසින් නොපැළඳිය යුතු ය ; නොඇඳිය යුතු ය.

(ආ) මේ ඡේදයේ කාර්යය සඳහා -

"ප්‍රසිද්ධ ස්ථානය" යන්නට, යම් ප්‍රසිද්ධ මාර්ගයක්, යම් ගොඩනැගිල්ලක්, යම් ආවරණය කරන ලද හෝ විවෘත ප්‍රදේශයක්, යම් වාහනයක් හෝ වෙනත් යම් ආකාරයක ප්‍රවාහන ක්‍රමයක් ඇතුළත් වේ;

"සම්පූර්ණ මුහුණ" යන්නෙන් දෙකන ද ඇතුළත්ව තැනැත්තකුගේ සම්පූර්ණ මුහුණ අදහස් වේ ;

"ප්‍රසිද්ධ මාර්ගයක්" යන්නට, යම් ප්‍රසිද්ධ පාලමකට උඩින් වූ යම් පාරක් හෝ ප්‍රසිද්ධ පාරකට අයත් හෝ සම්බන්ධ වූ යම් පදික වේදිකාවක්, කාණුවක්, කණ්ඩියක් හෝ අගලක් ඇතුළත් වේ.

(2) (1) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති තහනම එම ඇඟලුම, ඇඳුම හෝ වෙනත් යම් ද්‍රව්‍යය යම් ලිඛිත නීතියක් මඟින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ නියම කරනු ලැබුවේ නම් සහ බලය දෙනු ලැබුවේ නම් අදාළ නොවිය යුතු ය.

(3) (1) වන ඡේදයේ විධිවිධානවලට අනුකූලවීම පැහැර හැරීම මේ නියෝග උල්ලංඝනය කිරීමක් විය යුතු ය.

ආගමික, අන්තවාදී හෝ අන්තගාමී මතවාද පිළිබඳ තහනම

32ආ. (1) කිසිම තැනැත්තකු විසින් ත්‍රස්තවාදය හෝ නිශ්චිත ත්‍රස්තවාදී ක්‍රියාකාරකමක් අතිශයින් වර්ණනා කරන, දිරි ගන්වන, ප්‍රවර්ධනය කරන හෝ ඒ සඳහා සහාය දෙන ආගමික හෝ යම් අන්තවාදී හෝ අන්තගාමී මතවාද දේශනා කිරීමේ නොයෙදිය යුතු ය.

(2) කිසිම තැනැත්තකු විසින් ත්‍රස්තවාදය හෝ නිශ්චිත ත්‍රස්තවාදී ක්‍රියාකාරකමක් අතිශයින් වර්ණනා කරන, දිරි ගන්වන, ප්‍රවර්ධනය කරන හෝ ඒ සඳහා සහාය දෙන ආගමික හෝ යම් අන්තවාදී හෝ අන්තගාමී මතවාද හෝ ත්‍රස්තවාදය හෝ නිශ්චිත ත්‍රස්තවාදී ක්‍රියාකාරකමක් අතිශයින් වර්ණනා කරන, දිරිගන්වන, ප්‍රවර්ධනය කරන හෝ ඒ සඳහා සහාය දෙන යම් ආගමික, අන්තවාදී හෝ අන්තගාමී මතවාද හා සම්බන්ධ යම් අධ්‍යාපනික කටයුත්තක් සඳහා උපදෙස් දෙනු ලබන, උගන්වනු ලබන හෝ දේශනා කරනු ලබන උපදේශකයකු, ගුරුවරයකු, කථිකාචාර්යවරයකු ලෙස හෝ වෙනත් යම් ආකාරයකට සේවා නියුක්ත කිරීම සඳහා හෝ සේවය සැපයීම සඳහා පුරවැසියකු නොවන කිසිදු තැනැත්තකු නොයෙදිය යුතු ය.

(3) (1) වන සහ (2) වන ඡේදවල විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හැරීම මේ නියෝග උල්ලංඝනය කිරීමක් විය යුතු ය.

(5) 50 වන නියෝගයේ (3) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-ච

"(3) හදිසි නියෝගයක් යටතේ වූ වරදක් සම්බන්ධ යම් තොරතුරක් ලැබුණු යම් ග්‍රාම නිලධරයකු විසින් ඒ තොරතුර අප්‍රමාදව ආසන්නතම පොලිස් ස්ථානයට දැන්විය යුතු ය.".

(6) 75 වන නියෝගයේ (3) වන ඡේදයේ -

(අ) (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඉ) සංවිධානයේ කාර්ය සඳහා මුල්‍යමය හෝ ඉහත නිශ්චිතවම දක්වා ඇති වෙනත් යම් ආකාරයක ආධාර ඉල්ලා සිටීම, එකතු කිරීම හෝ එවැනි යම් ආධාරයක් දීම;" හෝ ; සහ

(ආ) එම ඡේදයේ (ඉ) සහ (ඊ) ඡේද, පිළිවෙලින් (ඊ) සහ (උ) ඡේද ලෙස නැවත අක්ෂර යෙදීමෙන්.

(7) මේ නියෝගවල උපලේඛනයේ (ඔ) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන්:-

"(ඕ) 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 3 වන වගන්තිය මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය විසින් හෝ ඒ අධිකාරිය සම්බන්ධයෙන් ඉටුකිරීමට අවශ්‍ය හෝ ඉටු කළ යුතු කවර වූ හෝ ආකාරයක සියලු සේවා, කාර්ය හෝ කම්කරු කටයුතු.".

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.